WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය

### ලකුණු දීමේ පටිපාටිය









මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

### අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය**

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) ලකුණු 40

**II පත්‍රය**

| | | |
|---|---|---|
| 1. ප්‍රශ්නය | ලකුණු 20 | |
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04 කට ලකුණු 40 |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |

| | |
|---|---|
| **I පත්‍රය** | ලකුණු 40 |
| **II පත්‍රය** | ලකුණු 60 |
| **අවසාන** | ලකුණු 100 |

WWW.OLEVELAPI.COM

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................... √ △ $\frac{4}{5}$

(ii) ............................................... √ △ $\frac{3}{5}$

(iii) ............................................... √ △ $\frac{3}{5}$

(03) එකතුව → □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

WWW.OLEVELAPI.COM

01. කවුළු පත්‍රය සැකසීම
   I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
   II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
   III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
   IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
   V. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා

දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :-** **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

WWW.OLEVELAPI.COM

OL/2020/63/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

| | |
|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II |
| முயற்சியாண்மைக் கற்கை | I, II |
| Enterpreneurship Studies | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. 'ව්‍යවසායකයා තමාගේ අභිමතය පරිදි තීරණ ගැනීම හා වැඩ කිරීම සිදු කරයි.' මෙම ප්‍රකාශයෙන් පෙන්නුම් කෙරෙන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ
   (1) නිර්මාණශීලීත්වයයි. (2) ස්වයං පෙළඹවීමයි.
   (3) අනාගත දැක්මයි. (4) ස්වාධීනත්වයයි.

2. අරමුණු සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ව්‍යවසායකයකු විසින් කළ යුතු ප්‍රධාන කාර්යයක් වන්නේ
   (1) ව්‍යාපාර පරිසර තත්ත්ව විශ්ලේෂණය කර බැලීම ය.
   (2) ව්‍යාපාරයේ පරිපාලන කටයුතු සැලසුම් කිරීම ය.
   (3) ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය සොයා බැලීම ය.
   (4) වඩාත් හොඳ ව්‍යාපාරික ස්ථානයක් තෝරා ගැනීම ය.

3. ව්‍යාපාරිකයකුට වඩා ව්‍යවසායකයකු තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ
   (1) අවදානම් භාර ගැනීමයි. (2) පොදු අරමුණක් පැවතීමයි.
   (3) නවෝත්පාදන හඳුන්වාදීමයි. (4) ඉහළ ප්‍රතිලාභයක් ලැබීමයි.

4. ව්‍යවසායකයාගේ ලාභය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ
   (1) ව්‍යාපාරික ස්ථානයේ පිහිටීම ය.
   (2) ව්‍යවසායකයාගේ ඇති මිත්‍රශීලීභාවය ය.
   (3) නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය ය.
   (4) භාණ්ඩයේ ලකුණු කළ මිල ය.

5. ස්ථිර රැකියාවක නිරත වන පුද්ගලයකුට වඩා, ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ
   (1) කීර්ති ප්‍රශංසා ලබා ගැනීමට හැකි වීම ය.
   (2) නිශ්චිත පරිසර තත්ත්වයක් යටතේ කටයුතු කළ හැකි වීම ය.
   (3) භාවිතයට නොගත් හැකියාවන් භාවිත කළ හැකි වීම ය.
   (4) පහසුවෙන් ඉහළ මූල්‍ය ප්‍රතිලාභයක් ලබා ගත හැකි වීම ය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....



6. වර්තමානයේ ප්‍රචලිත වෙමින් පවතින 'විද්‍යුත් ගෙවීමේ ක්‍රමය' හැඳින්විය හැක්කේ
   (1) නව සොයා ගැනීමක් ලෙස ය. (2) දිගුවක් ලෙස ය.
   (3) අනුකරණය කිරීමක් ලෙස ය. (4) සංකලනයක් ලෙස ය.

7. ව්‍යාපාරයක, කාලානුරූපීව වෙනස් නොවී කටයුතු කිරීමේ හැකියාව සැලකිය හැක්කේ
   (1) ශක්තියක් ලෙස ය. (2) තර්ජනයක් ලෙස ය.
   (3) දුර්වලතාවක් ලෙස ය. (4) අභියෝගයක් ලෙස ය.

8. ව්‍යාපාරයකට පාලනය කළ හැකි පාරිසරික සාධක ඇතුළත් වන්නේ
   (1) ආසන්නතම පරිසරයට ය. (2) අභ්‍යන්තර පරිසරයට ය.
   (3) බාහිර පරිසරයට ය. (4) ගෝලීය පරිසරයට ය.

9. ව්‍යවසායකයින්ට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසනු ලබන්නේ
   (1) දක්ෂ කළමනාකරුවන් ය. (2) ව්‍යාපාර පරිසර සාධක ය.
   (3) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා ය. (4) විවිධ දිරිගැන්වීම් ය.

10. ව්‍යාපාර සංවිධානයක පොදු ලක්ෂණයක් වන්නේ
   (1) සීමිත සම්පත් භාවිත කිරීමයි. (2) කළමනාකරණ කාර්යයන් ඉටු කිරීමයි.
   (3) ලාභය අරමුණු කර ගැනීමයි. (4) විධිමත් සැලසුමකට අනුව කටයුතු කිරීමයි.

11. 'ඉලක්කගත පාරිභෝගිකයා' ලෙස හඳුන්වනු ලබන්නේ
   (1) අදාළ භාණ්ඩය හෝ සේවාව දැනටමත් මිලදී ගැනීම සඳහා පොළඹවාගෙන ඇති පාරිභෝගිකයා ය.
   (2) අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට කැමති, ආදායමක් ඇති පාරිභෝගිකයා ය.
   (3) අනාගතයේදී අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට පොළඹවා ගත හැකි යැයි අපේක්ෂා කරන පාරිභෝගිකයා ය.
   (4) අනාගතයේදී අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ඇති පාරිභෝගිකයා ය.

12. 'කොවිඩ්-19 වසංගතය ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරයි.' මෙම සාධකය අයත් වන්නේ
   (1) ප්‍රජා පරිසරයට ය. (2) ස්වාභාවික පරිසරයට ය.
   (3) සමාජ හා සංස්කෘතික පරිසරයට ය. (4) සමාජයීය පරිසරයට ය.

13. කේවලස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා සංස්ථාපිත සමාගම් ලෙස ව්‍යාපාර වර්ගීකරණය කිරීමේ පදනම වන්නේ
   (1) හිමිකාරිත්වයයි. (2) අරමුණයි.
   (3) කළමනාකාරිත්වයයි. (4) ව්‍යාපාරයේ ස්වභාවයයි.

14. සිරිමල් 'විලාසිතා' නමින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා අදාළ වාර්තා, ආකෘති හා ගාස්තු භාරදිය යුත්තේ
   (1) ග්‍රාම නිලධාරී වෙත ය. (2) ප්‍රාදේශීය ලේකම් වෙත ය.
   (3) තැපැල් ස්ථානාධිපති වෙත ය. (4) දිස්ත්‍රික් ලේකම් වෙත ය.

15. ව්‍යවසායකයා තම ව්‍යාපාරයේ විවිධ කාර්යයන් ඉටු කරයි. මේවා අතුරින් සේවකයින් පෙළඹවීම හා ඔවුන්ට අවශ්‍ය මඟපෙන්වීම අයත් වන්නේ
   (1) ව්‍යවසායකයාගේ භූමිකාවට ය. (2) නායකයාගේ භූමිකාවට ය.
   (3) කළමනාකරුගේ භූමිකාවට ය. (4) අයිතිකරුගේ භූමිකාවට ය.

16. ව්‍යවසායකයකු සතුවිය යුතු සංකල්පනාත්මක කුසලතාවක් වන්නේ
   (1) කණ්ඩායමක් වශයෙන් එකට එකතු වී වැඩ කිරීම ය.
   (2) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා හඳුනා ගැනීම ය.
   (3) විවිධ පාර්ශ්ව අතර තොරතුරු බෙදා හැරීම ය.
   (4) නව වෙළෙඳපොළ සොයා ගැනීම ය.

[අනෙක් පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....



17. කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ
    (1) ණය පහසුකම් ලබා නොගෙන ව්‍යාපාර කටයුතු මෙහෙයවීම ය.
    (2) නිවැරදි සැලසුම් සැකසීම සහ ඒවාට අනුව ක්‍රියාත්මක වීම ය.
    (3) සැමවිටම තම අභිමතය පරිදි ව්‍යාපාර කටයුතු සැලසුම් කර පවත්වාගෙන යෑම ය.
    (4) ඉහළ ප්‍රතිලාභයක් සහිත ව්‍යාපාර කටයුත්තක නියැලීම ය.

18. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වන්නේ
    (1) නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ය.
    (2) සේවකයන් බඳවා ගැනීමේදී ය.
    (3) බැංකු ණයක් සඳහා ඇප ඉදිරිපත් කිරීමේදී ය.
    (4) ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේදී ය.

19. ව්‍යවසායකයකු විසින් වෙළඳපොළ විශ්ලේෂණයක් කිරීමේ මූලික අරමුණක් වන්නේ
    (1) අලෙවි සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.
    (2) නිෂ්පාදන සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.
    (3) පරිපාලන සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.
    (4) මූල්‍ය සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.

20. සීමාසහිත සිරිමෙවන් එන්ටප්‍රයිසස් ආයතනය විසින් තම සේවකයින්ට සේවයට නොපැමිණි දින නොසලකා මාසික වැටුප නියමිත ආකාරයට ගෙවීම් කරන ලදී. මෙම ආයතනය සම්පූර්ණ කරන ලද්දේ
    (1) ආර්ථික වගකීමකි. (2) කාලීන වගකීමකි.
    (3) සදාචාරාත්මක වගකීමකි. (4) නීතිමය වගකීමකි.

21. වර්තමානයේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ නිවසටම බෙදා හැරීමේ සේවාව අයත් වන්නේ
    (1) ප්‍රාථමික අංශයට ය. (2) ද්විතීයික අංශයට ය.
    (3) තෘතීයික අංශයට ය. (4) නිෂ්පාදන අංශයට ය.

22. සංස්ථාපිත සමාගමකට ගිවිසුම්වලට එළඹීම සඳහා ඇති අයිතිය හිමි වනුයේ
    (1) අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය වන නිසා ය.
    (2) කොටස් නිකුත් කර ප්‍රාග්ධනය රැස්කර ගන්නා නිසා ය.
    (3) නෛතික පුද්ගලභාවයක් හිමිවන නිසා ය.
    (4) වගකීම සීමාසහිත වන නිසා ය.

23. හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වඩාත් යෝග්‍ය වන්නේ
    (1) ලිඛිතව ය. (2) වාචිකව ය.
    (3) ව්‍යංගයෙන් ය. (4) ලියාපදිංචි කිරීමෙන් ය.

24. 'වුවමනා' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) වුවමනා උත්පත්තියත් සමග ම ඇති වේ.
    (2) වුවමනා කාලානුරූපීව වෙනස් නොවේ.
    (3) වුවමනා නිර්මාණය කරනු ලබන්නේ ව්‍යවසායකයින් විසින් ය.
    (4) වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් නොවේ.

25. ව්‍යවසායකත්වයට **එරෙහිවන** ප්‍රධාන සමාජයීය සාධකයක් වන්නේ
    (1) අධ්‍යාපනය තුළින් ව්‍යවසායකත්වය දිරිමත් කිරීම ය.
    (2) ව්‍යවසායකත්වය සඳහා ප්‍රමාණවත් රාජ්‍ය දිරිගැන්වීම් තිබීම ය.
    (3) වැටුප් ලබන රැකියා සඳහා ඉහළ පිළිගැනීමක් තිබීම ය.
    (4) අවදානම් භාර ගැනීමට නව ව්‍යවසායකයින් තුළ ඇති කැමැත්ත ය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....



**26.** කාන්තා ව්‍යවසායකත්වයට බාධාවක් වන්නේ

(1) සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අවස්ථා බහුල වීම ය.

(2) පෞද්ගලික ජීවිත භූමිකාව හා ව්‍යවසායකත්ව භූමිකාව සමබරව පවත්වා ගැනීමට ඇති අවශ්‍යතාව ය.

(3) කාන්තාවන් ඉහළ අධ්‍යාපනයක් ලබන නිසා රැකියා අවස්ථා බහුල වීම ය.

(4) ජනගහනයෙන් බහුතරයක් කාන්තාවන් වීම නිසා කාන්තා ව්‍යවසායකත්වයට තරගකාරීත්වයක් පැවතීම ය.

**27.** අමුද්‍රව්‍ය පිරිවැය සැලකිල්ලට ගනු ලබනුයේ

(1) නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී ය.

(2) නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කිරීමේදී ය.

(3) අලෙවි හා බෙදාහැරීමේ පිරිවැය ගණනය කිරීමේදී ය.

(4) ආයෝජන පිරිවැය ගණනය කිරීමේදී ය.

**28.** වරලත් හිමියා විසින් තම වෙළඳ නාමය යටතේ භාණ්ඩ විකිණීම වෙනුවෙන් වරලත් ලාභියාගෙන් ගාස්තුවක් අය කෙරේ. මෙය හඳුන්වන්නේ

(1) කල්බදු ලෙස ය.

(2) පුරස්කාරය ලෙස ය.

(3) කොමිස් මුදල ලෙස ය.

(4) නියෝජිත ගාස්තු ලෙස ය.

**29.** ව්‍යාපාරවල නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ලබා දෙන උපදෙස් සැලකිය හැක්කේ

(1) යටිතල පහසුකමක් ලෙස ය.

(2) මූල්‍ය දිරිගැන්වීමක් ලෙස ය.

(3) මූල්‍ය නොවන දිරිගැන්වීමක් ලෙස ය.

(4) විකුණුම් ප්‍රවර්ධනයක් ලෙස ය.

**30.** ව්‍යවසායකත්ව සංස්කෘතියක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකයකු

(1) සැමවිටම සාර්ථකත්වය අපේක්ෂා කරන්නෙකු වේ.

(2) නවෝත්පාදනයේ යෙදෙන්නෙකු වේ.

(3) සමාජ සම්මතයන් කෙරෙහි දැඩි විශ්වාසයෙන් කටයුතු කරන්නෙකු වේ.

(4) පරිසරය විශ්ලේෂණය නොකර ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ව්‍යාපාර කටයුතු කරන්නෙකු වේ.

**31.** සුනිල් තම ඉතිරි කරගත් මුදලක් යොදවා, තම අභිමතය පරිදි පවුලේ සාමාජිකයින් සම්බන්ධ කර ගනිමින් තමා ජීවත්වන ප්‍රදේශයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ලක්ෂණවලට අනුව සුනිල්ගේ ව්‍යාපාරය

(1) මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.

(2) වරලත් ව්‍යාපාරයකි.

(3) කුඩා පරිමාණ ව්‍යාපාරයකි.

(4) හවුල් ව්‍යාපාරයකි.

**32.** දියුණු වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම අවශ්‍ය වන්නේ

(1) ආර්ථික වර්ධනය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා ය.

(2) සම්පත් පවතින ආකාරයෙන් ම පවත්වා ගෙන යාම සඳහා ය.

(3) නව රැකියා නිර්මාණය කරන්නන් බිහි කිරීම සඳහා ය.

(4) තරගකාරිත්වය පාලනය කිරීම සඳහා ය.

**33.** 'සමාජයීය ව්‍යවසායකයා' යනු

(1) පවතින භාණ්ඩ හෝ සේවා තවදුරටත් නවීකරණයට ලක් කරන්නා ය.

(2) සමාජයේ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කරන්නා ය.

(3) නව භාණ්ඩ හෝ සේවා සමාජයට ඉදිරිපත් කරන්නා ය.

(4) ව්‍යාපාරයේ අභ්‍යන්තර ගැටලුවලට නිර්මාණශීලී විසඳුම් ඉදිරිපත් කරන්නා ය.

[පස්වැනි පිටුව බලන්න.

**34.** සීමාසහිත පෞද්ගලික සමාගමක දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ
(1) එක් පුද්ගලයකුට වුව ද ආරම්භ කළ හැකි වීම ය.
(2) නෛතික පුද්ගලභාවයක් හිමි වීම ය.
(3) පොදු ජනතාවට කොටස් විකිණිය හැකි වීම ය.
(4) ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම ය.

**35.** අරුණ නැවුම් සුවඳකින් යුත් නව සබන් වර්ගයක් දේශීය වෙළඳපොළට ඉදිරිපත් කරයි. අරුණ වෙළඳපොළට ප්‍රවේශ වන්නේ
(1) පවතින භාණ්ඩයක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කරමින් ය.
(2) පවතින භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කරමින් ය.
(3) නව භාණ්ඩයක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කරමින් ය.
(4) නව භාණ්ඩයක් නව වෙළඳපොළට ඉදිරිපත් කරමින් ය.

**36.** ව්‍යාපාරයක් කෙරෙහි උනන්දුවන පාර්ශ්වයක් වන අයිතිකරුගේ ප්‍රධානතම අපේක්ෂාව වන්නේ
(1) ආයෝජන සුරක්ෂිතභාවයයි. (2) සමාජයීය සුරක්ෂිතභාවයයි.
(3) සේවක සුරක්ෂිතභාවයයි. (4) පරිසර සුරක්ෂිතභාවයයි.

**37.** 'තරගකරුවන්ගේ සැපයුම් විශ්ලේෂණය' ඇතුළත් වන්නේ
(1) අලෙවි සැලැස්මෙහි ය. (2) නිෂ්පාදන සැලැස්මෙහි ය.
(3) පරිපාලන සැලැස්මෙහි ය. (4) මූල්‍ය සැලැස්මෙහි ය.

**38.** ව්‍යාපාරයක ඇස්තමේන්තුගත වියදම් කිහිපයක් පහත දැක්වේ.
A – ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම රු. 15 000
B – ව්‍යාපාරය ලියාපදිංචි කිරීම රු. 2 500
C – ව්‍යාපාර ගොඩනැගිල්ල මිලදී ගැනීම රු. 200 000
D – විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම රු. 50 000

මේවායින් ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම් වන්නේ
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි. (4) A, B, C හා D සියල්ලම ය.

**39.** ව්‍යාපාරයක් සමාජයීය වගකීම් පිළිපැදීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ
(1) ව්‍යාපාරයේ සේවක සුභසාධනය ඉහළ යාම ය.
(2) ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම ස්ථාපිත වීම ය.
(3) ව්‍යාපාරික කටයුතු කෙරෙහි ඇති අවදානම අඩුවීම ය.
(4) ව්‍යාපාරික සැලසුම් සකස් කිරීමේ වියදම් අඩුවීම ය.

**40.** ප්‍රකාශ් තම ව්‍යාපාරය සඳහා ඉතිරි කරගත් රු. 400 000 ක මුදල ආයෝජනය කිරීමටත් රු. 300 000 ක බැංකු ණය මුදලක් හා කුලී පදනම මත වර්ෂයකට රු. 120 000කට ගොඩනැගිල්ලක් ලබා ගැනීමටත්, රු. 80 000කට ලීබඩු මිලදී ගැනීමටත් අපේක්ෂා කරයි.

ඉහත තොරතුරුවලට අනුව ප්‍රකාශ්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත
(1) මුළු අයෝජනය රු. 400 000 කි.
(2) මුළු මුදල් ගලා ඒම් රු. 300 000 කි.
(3) මුළු මුදල් ගලා යෑම් රු. 200 000 කි.
(4) මුළු ස්ථාවර වත්කම් රු. 200 000 කි.

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2020

| විෂයය අංකය<br>பாட இலக்கம் | 63 | විෂයය<br>பாடம் | ව්‍යවසායකත්ව අධ්‍යයනය |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 3 |
| 02. | 1 | 12. | 2 | 22. | 3 | 32. | 3 |
| 03. | 3 | 13. | 1 | 23. | 1 | 33. | 2 |
| 04. | 4 | 14. | 2 | 24. | 3 | 34. | 3 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 | 35. | 3 |
| 06. | 2 | 16. | 4 | 26. | 2 | 36. | 1 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 1 |
| 08. | 2 | 18. | 1 | 28. | 2 | 38. | 1 |
| 09. | 2 | 19. | 1 | 29. | 3 | 39. | 2 |
| 10. | 1 | 20. | 3 | 30. | 2 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | $\frac{25}{40}$ | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | $\frac{25}{40}$ |

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** සහජ නිර්මාණ කුසලතාවකින් හෙබි සිහිනි, ඓතිහාසික නගරයක ජීවත් වෙයි. ඇය නව නිර්මාණ කිරීමට ළමා වියේ සිට ම ප්‍රියතාවක් දැක්වූවා ය. පාසල් අධ්‍යාපනයෙන් පසු ඇය බතික් නිර්මාණ ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හැදෑරී ය. බතික් නිර්මාණ ප්‍රදර්ශනයක් නැරඹීමෙන් පසු බතික් ඇඳුම් සැකසීමේ ව්‍යාපාරයක් ඇරඹීමට ඇය සිහින මැව්වා ය. රජය දේශීය බතික් කර්මාන්තය සඳහා දිරිගැන්වීම් ලබා දෙන බැවින් සිහිනි, ඇඳුම් මැසීම පිළිබඳ විශේෂ හැකියාවක් ඇති සිතුම්ගේ ද සහාය ඇතිව බතික් ඇඳුම් සැකසීමේ ව්‍යාපාරයක් ඇරඹීමට තීරණය කළා ය. ව්‍යාපාරයේ නිපදවන බතික් ඇඳුම් එම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ට මෙන් ම දේශීය පාරිභෝගිකයින් සඳහා ද නිමි ඇඳුම් වෙළෙඳසැල් මගින් අලෙවි කිරීමට ඔවුහු අපේක්ෂා කරති. තම නිෂ්පාදිත පිළිබඳ විස්තර, අත් පත්‍රිකා හා අන්තර්ජාලය මගින් ප්‍රචාරය කිරීමටත් ඔවුහු බලාපොරොත්තු වෙති. සිහිනි හා සිතුම් 5% ක වාර්ෂික පොලී අනුපාතය මත රුපියල් 100 000ක බැංකු ණයක් ලබා ගැනීමටත් අවශ්‍ය අනෙකුත් මුදල් ඔවුන් දෙදෙනා විසින් සමානව යෙදවීමටත් තීරණය කර ඇත.

(i) සිහිනිට ව්‍යාපාර අදහසක් පහළ වීමට හේතු වූ මූලාශ්‍ර **දෙකක්** ලියන්න.

(ii) සිහිනි සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iii) ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරයේ ඉලක්කගත පාරිභෝගිකයින් පාර්ශ්ව **දෙකක්** හා අලෙවි ප්‍රවර්ධන උපක්‍රම **දෙකක්** දක්වන්න.

(iv) සිහිනි සහ සිතුම්ගේ ව්‍යාපාරයේ 'ශක්තියක්' හා 'අවස්ථාවක්' ලියන්න.

(v) සිහිනි සහ සිතුම්ට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග **දෙකක්** දක්වන්න.

- ඉහත දැක්වූ සිද්ධියේ සඳහන් ව්‍යාපාරයට අදාළ ඇස්තමේන්තුගත වියදම් පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| මැෂින් තුනක් මිල දී ගැනීම සඳහා | 90 000 |
| බතික් සැකසුම් උපකරණ මිල දී ගැනීම සඳහා | 45 000 |
| ව්‍යාපාර සැලැස්ම සැකසීම සඳහා | 10 000 |
| ව්‍යාපාර සමාරම්භක උත්සව වියදම් | 12 000 |
| නිෂ්පාදන වියදම් | 78 000 |
| පරිපාලන, මූල්‍ය හා බෙදාහැරීම් වියදම් | 65 000 |

- ඉහත සඳහන් තොරතුරු ඇසුරින් සිහිනි හා සිතුම්ගේ ව්‍යාපාරය හා සම්බන්ධ පහත සඳහන් දෑ ගණනය කර දක්වන්න.

(vi) ඇස්තමේන්තුගත මුළු ස්ථාවර වත්කම්

(vii) ඇස්තමේන්තුගත මුළු ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම්

(viii) ඇස්තමේන්තුගත මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව

(ix) ඇස්තමේන්තුගත මුළු ආයෝජනය

(x) අයිතිකරුවන් යොදවන යෝජිත ආයෝජන මුදල

(ලකුණු 02 × 10 = 20 යි)

(i)
- සහජ නිර්මාණශීලි කුසලතාවක් තිබීම.
- බතික් නිර්මාණ ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.
- බතික් නිර්මාණ ප්‍රදර්ශන නැරඹීමෙන් ලද ඇල්ම/ උනන්දුව.
- රජය විසින් බතික් කර්මාන්තය සඳහා දිරිගැන්වීම් ලබාදී තිබීම.

***(පිළිගත හැකි පිළිතුරු 1 කට ලකුණු 01 බැගින් පිළිතුරු 2 කට ලකුණු 02 යි)***

(ii)
- නිර්මාණශීලිත්වය
- නවෝත්පාදනය
- පරිසරයට අනුගතවීම හා අවස්ථා හඳුනාගැනීම
- අනාගත දැක්ම
- අවදානම් භාර ගැනීම

***(පිළිගත හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ සඳහා ලකුණු ලබා දෙන්න)***
***(එක් ගති ලක්ෂණයකට ලකුණු 01 බැගින් ගති ලක්ෂණ 02 කට ලකුණු 02යි)***

(iii)

<u>ඉලක්කගත පාරිභෝගිකයින්</u>

- විදේශීය සංචාරකයින්
- දේශීය පාරිභෝගිකයින්

<u>අලෙවි ප්‍රවර්ධන උපක්‍රම</u>

- අත් පත්‍රිකා
- අන්තර්ජාලය

*(එක් පිළිතුරකට ලකුණු ½ බැගින් පිළිතුරු 4 ට ලකුණු 02යි)*

(iv) <u>ශක්තියක්</u>

- බතික් නිර්මාණ පාඨමාලාවක් හදාරා තිබීම
- බතික් කර්මාන්තය පිළිබඳ සිහිනි සතු දැනුම
- ඇඳුම් මැසීම පිළිබඳ සිතුම් සතු හැකියාව

*(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 යි )*

<u>අවස්ථා</u>

- රජය දේශීය කර්මාන්ත සඳහා ලබා දෙන දිරි ගැන්වීම
- ඓතිහාසික නගරයක ජීවත්වීම නිසා සංචාරකයින් ගේ පැමිණීම සිදුවීම

*(නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01යි)*

(v)

- හවුල් ව්‍යාපාර
- සීමාසහිත පෞද්ගලික සමාගම්

*(එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)*

(vi) මුළු ස්ථාවර වත්කම් රු. 135 000 ක් ලෙස දැක්වීම හෝ

| | |
|---|---|
| මැෂින් | රු. 90 000 |
| උපකරණ | රු. <u>45 000</u> |
| | රු. <u>135 000</u> |

*(ලෙස පිළිතුරු දක්වා තිබේනම් ලකුණු 02 යි)*

| | |
|---|---|
| මැෂින් | රු. 90 000 |
| උපකරණ | රු. 45 000 |

*(එකතු කිරීම් නොමැතිව ඉහත අයුරින් අයිතම පමණක් දක්වා තිබේ නම් එක් අයිතමයකට ලකුණු ½ අයිතම 2ට ලකුණු 01 යි)*

W W W . O L E V E L A P I . C O M

(vii) ආරම්භ කිරීමට පෙර වියදම් රු. 22 000 ක් ලෙස දැක්වීම හෝ

| | | |
|---|---|---|
| ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සඳහා | රු. | 10 000 |
| ව්‍යාපාර සමාරම්භක උත්සව වියදම් | රු. | 12 000 |
| | | 22 000 |

***(ලෙස පිළිතුරු දක්වා තිබේනම් ලකුණු 02 යි)***

| | | |
|---|---|---|
| ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සඳහා | රු. | 10 000 |
| ව්‍යාපාර සමාරම්භක උත්සව වියදම් | රු. | 12 000 |

***(එකතු කිරීම් නොමැතිව ඉහත අයුරින් අයිතම පමණක් දක්වා තිබේ නම් එක් අයිතමයකට ලකුණු ½ අයිතම 2ට ලකුණු 01 යි)***

(viii) මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව රු. 143 000 ලෙස දැක්වීම හෝ

| | | |
|---|---|---|
| නිෂ්පාදන වියදම් | රු. | 78 000 |
| පරිපාලන මූල්‍ය හා බෙදා හැරීමේ වියදම් | රු. | 65 000 |
| | රු. | 143 000 |

***(ලෙස පිළිතුරු දක්වා තිබේනම් ලකුණු 02 යි)***

| | | |
|---|---|---|
| නිෂ්පාදන වියදම් | රු. | 78 000 |
| පරිපාලන මූල්‍ය හා බෙදා හැරීමේ වියදම් | රු. | 65 000 |

***(එකතු කිරීම් නොමැතිව ඉහත අයුරින් අයිතම පමණක් දක්වා තිබේ නම් එක් අයිතමයකට ලකුණු ½ අයිතම 2ට ලකුණු 01 යි)***

(ix) ඇස්තමේන්තුගත මුළු ආයෝජනය රු. 30 0000 හෝ

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් | රු. | 135 000 |
| ආරම්භ කිරීමට පෙර වියදම් | රු. | 22 000 |
| කාරක ප්‍රාග්ධනය | රු. | 143 000 |
| | රු | 300 000 |

WWW.OLEVELAPI.COM

***(ලෙස පිළිතුරු දක්වා තිබේනම් ලකුණු 02 යි)***

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් | රු. | 135 000 |
| ආරම්භ කිරීමට පෙර වියදම් | රු. | 22 000 |
| කාරක ප්‍රාග්ධනය | රු. | 143 000 |

***(එක් අයිතමයක් සඳහා ලකුණු ½ බැගින් අයිතම 3 සඳහා ලකුණු 1 ½ නිවැරදි පිළිතුරට ලකුණු ½ මුළු ලකුණු 02 යි)***

(x) අයිතිකරු යෙදවීම රු. 200 000/-

*(ලකුණු 02යි)*

මුළු ආයෝජනය රු. 300 000

බැංකු ණය රු. (100 000)

*(ලකුණු 01යි)*

*(මුළු ආයෝජන ඇස්තමේන්තු ආකෘතිය අනුව සකස් කර ඇත්නම් අදාළ කොටස් වලට අදාල පරිදි ලකුණු ලබා දෙන්න)*

*(මුළු ලකුණු* **02 x 10 = 20***)*

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | **(i)**<br>**2** | **(ii)**<br>**2** | **(iii)**<br>**2** | **(iv)**<br>**2** | **(v)**<br>**2** | **(vi)**<br>**2** | **(vii)**<br>**2** | **(viii)**<br>**2** | **(ix)**<br>**2** | **(x)**<br>**2** | මුළු ලකුණු<br>20/20 |

WWW.OLEVELAPI.COM

**2.** (i) 'ව්‍යවසායකත්වය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ව්‍යවසායකත්වය යනු පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනා ගෙන, අවදානම් දරමින්, නිර්මාණශීලිත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමේ, යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ ක්‍රියාවලියකි.

***(ඉහත නිර්වචනයේ යටින් ඉරි ඇඳී එක් කරුණක් සඳහා ලකුණු ½ බැගින් කරුණු 4 ක් සඳහා ලකුණු 02 යි)***

(ii) ව්‍යාපාර සංදර්භය තුළ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග **දෙකක්** නම් කර, ඒ එකිනෙක සඳහා උදාහරණය බැගින් දක්වන්න.

- ව්‍යාපාර ව්‍යවසායකයෝ
  නිදසුන් : සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා

- සමාජීය ව්‍යවසායකයෝ
  නිදසුන් : මහත්මා ගාන්ධිතුමා
  මාරි කියුරි මැතිනිය

***(පිළිගත හැකි දේශීය හෝ විදේශීය පුද්ගල චරිත සඳහා ලකුණු ලබාදෙන්න)***

- අභ්‍යන්තර ව්‍යවසායකයෝ/ ආයතනික ව්‍යාවසායකයෝ
  නිදසුන් : ගුණත්ව සම්මාන හිමිකරගත් රජයේ සහ පෞද්ගලික ආයතනවල ප්‍රධානීන්, විධායක නිළධාරීන්............
  ඵලදායීතා සම්මාන හිමිකරගත් විදුහල්පතිවරු

***(එක් ව්‍යවසායක වර්ගීකරණයකට ලකුණු ½ බැගින් ව්‍යවසාය වර්ග 02 ට ලකුණු 01 යි)***
***(එක් නිදසුනකට ලකුණු ½ බැගින් නිදසුන් 02 ට ලකුණු 01 යි)***

(iii) නවෝත්පාදන හඳුන්වා දිය හැකි ආකාර **දෙකක්** නිදසුන් මගින් පැහැදිලි කරන්න.

- නව සොයා ගැනීමක් : පෙර නොතිබූ නව භාණ්ඩයක් සේවාවක් හෝ ක්‍රියාවලියක් බිහි කිරීම
  නිදසුන් : ගුවන් යානය, දුරකථනය, ඩිජිටල් කැමරාව, විදුලි බල්බය, විද්‍යුත් වෙළඳාම

- දිගුවක් : පවතින භාණ්ඩයක හෝ සේවාවක හෝ ක්‍රියාවලියක හෝ නව භාවිතයක් හඳුන්වාදීම.
  නිදසුන් : විදුලි දුම්රිය, ස්මාර්ට් ජංගම දුරකථන,
  මේදය රහිත කිරි, පිසින ලද ආහාර,
  ස්වයං සේවා අලෙවි ක්‍රමය,
  විද්‍යුත් ගෙවීමේ ක්‍රම

- අනුකරණය : පවතින සංකල්පයකට සමානව නිපද වූ නිර්මාණාත්මක නව නිපැයුමක්
  නිදසුන් : අයිස්ක්‍රීම් බෙදා හැරීමේ ජංගම රථ ක්‍රමයටම බේකරි නිෂ්පාදිත බෙදා හැරීම

- සංකලනයක් : පවතින සංකල්ප හෝ සාධකවල නව සංයෝගයක් හෝ මිශ්‍රණයක් භාවිතා කර නව නිපැයුම් කිරීම
  නිදසුන් : LED විදුලි බල්බ යෙදූ වෙසක් තොරණ, හාල්පිටි භාවිතයෙන් බේකරි නිෂ්පාදිත

*(නවෝත්පාදන සිදුවන ආකාර 2 ක් සඳහන් කිරීමට ලකුණු ½ බැගින් නවෝත්පාද 02 කට ලකුණු 01 අදාළ නිදසුන් 2 ක් සඳහා දැක්වීමට ලකුණු ½ බැගින් ලකුණු 01යි)*

(iv) ව්‍යාපාරිකයා සහ ව්‍යවසායකයා අතර පවත්නා සමානකම් **හතරක්** ලියන්න.

- ආර්ථික කටයුත්තක යෙදීම
- අවදානමකට මුහුණදීම
- ගනුදෙනුවල නිරතවීම
- සම්පත් භාවිත කිරීම
- තරඟයට මුහුණ දීම
- පැවැත්ම ගැන සිතීම
- ස්වයං පෙළඹවීමක් තිබීම
- නිෂ්පාදනය, මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම

*(කරුණු 04 කට ලකුණු ½ බැගින් ලකුණු 02 යි)*

(v) ව්‍යවසායකයකුට සමාජයීය සුභසාධනය උදෙසා කළ හැකි කාර්යයන් **හතරක්** ලියන්න.

- රැකියා ලබාදීම
- නිවාස අහිමිවූවන්ට නිවාස සාදාදීම
- පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීම
- ගොඩනැගිලි ඉදි කරදීම හා උපකරණ ලබාදීම
- රජයේ සුබසාධක කටයුතු වලට උදව් කිරීම
- හදිසි ස්වාභාවික විපත් වලදී උපකාරී වීම

*(එක් කාර්යයකට ලකුණු ½ බැගින් කාර්යයන් 04 කට ලකුණු 02 යි)*

| (2) | (i) | (ii) | (iii) | (iv) | (v) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| | 2 | 2 | 2 | 2 | 2 | 10/10 |

WWW.OLEVELAPI.COM

**3.** (i) 'ව්‍යවසායකත්ව සංස්කෘතිය' කෙටියෙන් පැහැදිලි කරන්න.

ව්‍යවසායකයන්ටම ආවේණික වූ විශේෂිත ගති පැවැතිම්, ආකල්ප, විශ්වාස, අදහස්, හැසිරීම් රටා, චාරිත්‍ර වාරිත්‍ර, සම්මත යනාදී අංග වල එකතුව ව්‍යවසායකත්ව සංස්කෘතිය ලෙස හැඳින්වේ.

*(ලකුණු 02 යි)*

(ii) වර්තමානයේ කාන්තාවන්ට ව්‍යාපාර පරිසරය තුළින් ඇති කරන ව්‍යාපාර අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

- සේවා සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය වී තිබීම
- සුළු ආයෝජනයකින් සහ අඩු අවදානමක් සහිතව ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථා බහුලව තිබීම
- කාන්තාවන් සඳහාම විශේෂිත වූ මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් හඳුන්වා දී තිබීම
- කාන්තාවන් කෙරෙහි පැවති සමාජ ආකල්ප වෙනස් වෙමින් පැවතීම

*(අවස්ථාවක් සඳහා ලකුණු 01 බැගින් අවස්ථා 02 සඳහා ලකුණු 02 යි)*

(iii) ව්‍යාපාර ආරම්භ කරන්නන්ට රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

- ව්‍යවසායකයින්ට නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා උනන්දුව ඇති කරවීමට
- ව්‍යවසායකයින්ට සාර්ථක ප්‍රවේශයක් ලබා දීමට
- ව්‍යවසායකයින් ගේ ව්‍යාපාර අදහස් ව්‍යාපාර බවට පරිවර්තනය කිරීමට අවස්ථාවක් ලබාදීමට
- ව්‍යාපාර ආරම්භ කරන්නන් තුළ ආත්ම විශ්වාසය හා සුබවාදී ආකල්ප ඇති කරවීම සඳහා
- රජයක් විසින් අපේක්ෂා කරන සමාජයීය සුබසාධන කටයුතු පවත්වා ගෙන යාම සඳහා

*(එක් හේතුවක් සඳහා ලකුණු 01 බැගින් හේතු 02 ක් දැක්වීමට ලකුණු 02 යි)*

(iv) ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන ප්‍රධාන පාර්ශ්වයක් වශයෙන් පාරිභෝගිකයින් විසින් ව්‍යාපාරයකින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂා **දෙකක්** ලියන්න.

- සාධාරණ මිල
- ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීම
- පහසුවෙන් භාණ්ඩ ලබා ගත හැකි වීම
- පාරිභෝගික ආරක්ෂාව සහතික කර ගැනීම

*(එක් කරුණක් සඳහා ලකුණු 01 බැගින් කරුණු 02 ක් දැක්වීමට ලකුණු 02 යි)*

(v) වර්තමාන සමාජයීය හා ආර්ථික පරිසරය තුළ ව්‍යවසායකයකු වීමට කාන්තාවන් තුළ ඇති ශක්තීන් **දෙකක්** සඳහන් කරන්න.

- කාන්තාවන්ටම ආවේණික වූ කුසලතා යොදා ගත හැකි වීම
- ස්වයං විනයක් පැවතීම
- පුද්ගලික ජීවිතය සහ ව්‍යාපාරික කාර්යයන් සමබරව කළමනාකරණය කර ගැනීමට ඇති හැකියාව
- කාලය නිසිපරිදි ප්‍රයෝජනයට ගැනීම
- නිර්මාණශීලිත්වය ඉහළ මට්ටමක පැවතීම
- පිරිමැසුම් සහිත බව
- කාන්තාවන් සාධාරණ හා විශ්වාස කළ හැකි බවට සමාජය තුළ පවතින ආකල්ප
- විවිධ පාර්ශව සමඟ සුහද සම්බන්ධතා ගොඩනගා ගැනීම හා ඒ තුළින් විශ්වාසය ගොඩනගා ගැනීමට ඇති හැකියාව

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02 යි)*

WWW.OLEVELAPI.COM

| 3 | (i) | (ii) | (iii) | (iv) | (v) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| | 2 | 2 | 2 | 2 | 2 | 10/10 |

**4.** (i) ව්‍යාපාර, අරමුණ අනුව වර්ග කර දක්වන්න.

- ලාභ අරමුණු කරගත් ව්‍යාපාර
- ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර

***(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02 යි)***

(ii) හවුල් ගිවිසුමක ඇතුළත් වන කරුණු **හතරක්** දක්වන්න.

- හවුල්කරුවන් ප්‍රාග්ධන සපයන ආකාරය
- හවුල්කරුවන් ලාබ පාඩු බෙදාගන්නා ආකාරය
- හවුල්කරුවන් ව්‍යාපාරයේ කටයුතුවලට දායක වන ආකාරය
- හවුල්කරුවන් වැටුප් ලබා ගැනීම සම්බන්ධ තොරතුරු
- හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්
- හවුල් ව්‍යාපාරයේ කටයුතු අවසන් කිරීම සම්බන්ධ තොරතුරු
- ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් සපයනු ලබන ණය සඳහා පොලී ගෙවීම

***(කරුණු එකකට ලකුණු ½ බැගින් කරුණු 4කට ලකුණු 02 යි)***

(iii) සාංගමික ව්‍යවස්ථාවලියක ඇතුළත් තොරතුරු **දෙකක්** සඳහන් කරන්න.

- සමාගමේ පරමාර්ථ
- සමාගමේ කොටස් හිමියන්ගේ බැඳීම් හා අයිතිවාසිකම්
- සමාගමේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ තොරතුරු

***(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2කට ලකුණු 02යි)***

(iv) වරලත් ව්‍යාපාරයක් හා සම්බන්ධ පාර්ශ්ව **දෙක** නම් කර, එම එක් එක් පාර්ශ්වවල කාර්යය බැගින් සඳහන් කරන්න.

- වරලත්හිමියා/ වරලත්කරු
- වරලත් ලාභියා

***(එක් පාර්ශවයනට ලකුණු ½ බැගින් පාර්ශව 2කට ලකුණු 01 යි)***

<u>වරලත්හිමියාගේ කාර්යයන් :</u>

- වරලත් ලාභියාට නිශ්චිත වෙළෙඳපොළ ප්‍රදේශයක තම සන්නම් නාමය භාවිතා කරමින් භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීමට අවසර ලබා දීම
- මූල්‍ය පහසුකම් සැපයීම
- ව්‍යාපාර ස්ථානය සකස්කර දීම
- කළමනාකරණ පුහුණුව ලබාදීම

<u>වරලත් ලාභියාගේ කාර්යයන් :</u>

- වරලත් හිමියාගේ සන්නම් නාමය භාවිතා කරමින් නිශ්චිත වෙළඳපොළ ප්‍රදේශයක භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීම
- නියමිත පරිදි පුරස්කාර ගෙවීම

*(එක් කරුණකට ලකුණ ½ බැගින් කරුණ 2කට ලකුණ 01 යි)*

(v) සීමාසහිත පෞද්ගලික සමාගම්වල වාසි **හතරක්** ලියන්න.

- එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කළ හැකි වීම
- පවුලේ සමාජිකයින්, නෑදෑ හිතමිතුරන් සම්බන්ධ කර ගනිමින් සමාගම ආරම්භ කළ හැකි වීම
- විධිමත්බවක් හා ඉහළ පිළිගැනීමක් පැවතීම
- වගකීම සීමිත වීම
- නෛතික පුද්ගලභාවයක් හිමිවීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම

**(වාසි එකකට ලකුණු $^1/_2$ බැගින් වාසි 04 කට ලකුණු 02 යි)**

| 4 | (i) | (ii) | (iii) | (iv) | (v) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| | 2 | 2 | 2 | 2 | 2 | 10 / 10 |

**5.** (i) ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ව්‍යවසායකයකුගේ මූලික කාර්යය දක්වන්න.

- ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමේදී ව්‍යවසායකයාගේ මූලික කාර්යය වන්නේ ව්‍යාපාර සැලසුම් පිළියෙල කිරීමයි.

**(ලකුණු 02 යි)**

(ii) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත විය යුතු මූලික කරුණු **දෙක** දක්වන්න.

- ව්‍යාපාර මඟින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු පිහිටුවීම
- අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට අදාළ විවිධ කාර්යයන් සංවිධානය කරන ආකාරය

***(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ලකුණු 02 යි)***

***හෝ***

- විධායක සාරාංශය
- පරිපාලන සැලැස්ම
- අලෙවි සැලැස්ම
- මූල්‍ය සැලැස්ම
- නිෂ්පාදන සැලැස්ම

WWW.OLEVELAPI.COM

***(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ලකුණු 02 යි)***

(iii) ව්‍යවසායකයකුට ව්‍යාපාර සැලැස්මක් නොමැතිවීමෙන් මුහුණ දීමට සිදු වන ගැටලු **හතරක්** ලියන්න.

- ව්‍යාපාර අදහස පැහැදිලි නොවීම
- ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට නොහැකිවීම
- ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීමට නොහැකිවීම
- ව්‍යාපාරයේ අනාගත දිශාව පැහැදිලි නොවීම
- අරමුදල් සම්පාදනය කර ගැනීමට අපහසුවීම
- වෙළෙඳපොළ පිළිබඳව හොඳ තක්සේරුවක් ලබා ගත නොහැකිවීම
- ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට අපහසු වීම

**(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 04 කට ලකුණු 02 යි)**

(iv) විධායක සාරාංශයක ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

- ව්‍යාපාර සමස්තය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මනසේ නිර්මාණය කර ගත හැකි වීම
- ව්‍යාපාරයේ නම, කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ දැනගත හැකි වීම
- අලෙවිකරණ සැලසුමේ ඉතාමත් වැදගත් කරුණු දැනගත හැකි වීම
- නිෂ්පාදන සැලසුමේ ඉතාමත් වැදගත් කරුණු දැනගත හැකි වීම
- පරිපාලන සැලසුමේ ඉතාමත් වැදගත් කරුණු දැනගත හැකි වීම
- මූල්‍ය සැලසුමේ ඉතාමත් වැදගත් කරුණු දැනගත හැකි වීම

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)**

(v) අලෙවි සැලැස්මක අන්තර්ගත විය යුතු කරුණු **හතරක්** දක්වන්න.

- වෙළඳපල විශ්ලේෂණය
- යෝජිත ව්‍යාපාරයේ අලෙවිකරණ උපායමාර්ග
- විකුණුම් පුරෝකථනය
- අලෙවි ආදායම් හා අලෙවි වියදම්
- අලෙවි ස්ථාවර වත්කම්

**(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 04 කට ලකුණු 02 යි)**

| 5 | (i) | (ii) | (iii) | (iv) | (v) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| | 2 | 2 | 2 | 2 | 2 | 10<br>10 |

**6.** (i) කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් **දෙකක්** සඳහන් කරන්න.

- සීමිත සම්පත් ප්‍රමාණයකින් (ප්‍රාග්ධනය) වුව ද ව්‍යාපාර ආරම්භ කළ හැකි වීම
- පවත්නා දේශීය තාක්ෂණය වුවද භාවිතා කළ හැකි වීම
- ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී පරිසර වෙනස්වීම්වලට පහසුවෙන් අනුගතවීමට හැකිවීම
- ව්‍යාපාර කටයුතුවලදී රජයෙන් ලැබෙන විශේෂ දිරිගැන්වීම්
- සේවකයින් බඳවාගැනීම හා පුහුණු කිරීම පහසුවීම
- සේවකයින්ගේ බහුවිධ කුසලතාවලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම
- කුඩා පරිමාණ ව්‍යාපාරවල සේවයේ නියුතු සේවක පිරිස් වැඩි වරප්‍රසාද අපේක්ෂා නොකිරීම
- ව්‍යාපාර කටයුතු වලට පවුලේ සාමාජිකයින්ගේ සහභාගීත්වය ලබා ගත හැකි වීම
- ගතික පරිසරයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ පහසුව

**(කරුණු එකකට ලකුණු 01 කරුණු 2කට ලකුණු 02 යි)**

(ii) කොවිඩ් - 19 පැතිරීම හේතුවෙන් සුළු ව්‍යාපාර සඳහා ඇති වී තිබෙන ව්‍යාපාර අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

- මුහුණු ආවරණ නිෂ්පාදනය සහ බෙදාහැරීම
- ප්‍රතිශක්තිකරණය වැඩි කරන ඖෂධ නිෂ්පාදනය සහ බෙදාහැරීම
- විෂබීජනාශක දියර නිෂ්පාදනය සහ බෙදාහැරීම
- පාරිභෝගිකයින්ට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය නිවෙසටම සැපයීමේ සේවාව
- අන්තර්ජාල භාවිත කර පාරිභෝගිකයින්ට අවශ්‍ය භාණ්ඩ නිවසටම සැපයීම

**(එවැනි පිළිගත හැකි ව්‍යාපාර අවස්ථාවකට ලකුණු 01 බැගින් අවස්ථා 2 ක් සඳහා ලකුණු 02 යි)**

(iii) ව්‍යාපාර සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබා දෙන ආයතන **දෙකක්** සඳහන් කර, ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් එක බැගින් දක්වන්න.

මූල්‍යමය දිරි ගැන්වීම් ලබාදෙන ආයතන

- සියළුම දේශීය වාණිජ බැංකු (ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, HNB බැංකුව ආදී වාණිජ බැංකු)
- වාණිජ බැංකු නොවන වෙනත් මූල්‍ය ආයතන
- DFCC බැංකුව
- RDB බැංකුව (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව)
- ග්‍රාමීය බැංකුව
- සණස බැංකුව
- සමෘද්ධි බැංකුව

මෙම ආයතන මඟින් ලබාදෙන දිරිගැන්වීම්

- සහන පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාදීම
- ඇප සුරකුම් රහිත ණය ලබාදීම
- ණය ආපසු ගෙවීම් කාල සීමාව වැඩි කිරීම
- මූල්‍යමය ප්‍රධාන

මූල්‍යමය නොවන දිරිගැන්වීම් ලබා දෙන ආයතන

- කාර්මික සංවර්ධන මණ්ඩලය
- කාර්මික තාක්ෂණ ආයතන
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය

මෙම ආයතන මඟින් ලබාදෙන දිරිගැන්වීම්

- ව්‍යවසායකයින් පුහුණු කිරීම
- සේවකයින් පුහුණු කිරීම
- ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට උපදේශනය ලබාදීම
- තාක්ෂණික පුහුණුව ලබාදීම
- අලෙවිකරණය පිළිබඳ පුහුණුව ලබාදීම
- ඇසුරුම්කරණය පිළිබඳ දැනුම ලබාදීම
- වෙළඳපොළ සොයාදීම

**(ආයතනය නම් කිරීම සඳහා ලකුණු $^1/_2$ බැගින් ආයතන 2කට ලකුණු 01 යි)**

**(අදාල සේවාව සඳහා ලකුණු $^1/_2$ බැගින් සේවාවන් 2 කට ලකුණු 01 යි)**

(iv) ව්‍යවසායකයකු ව්‍යාපාර කටයුතු කිරීමේදී ඉටු කළ යුතු භූමිකා **දෙකක්** සඳහන් කර, ඒ එක් එක් භූමිකාව සඳහා උදාහරණය බැගින් දක්වන්න.

- අයිතිකරුගේ භූමිකාව -

උදා : - ව්‍යාපාරයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම
ලාභ හෝ පාඩු විඳ දරා ගැනීම
අවශ්‍ය සම්පත් සැපයීම
අවදානම් දැරීම

වැදගත් තීරණ ගැනීම

- කළමනාකරුගේ භූමිකාව -
  උදා : - ව්‍යාපාර සැලසුම් සකස් කිරීම
  සැලසුමට අනුව කටයුතු සිදු වේ දැයි විමසා බැලීම
  ව්‍යාපරයේ සම්පත්, අරමුණු ලඟා කර ගැනීමට නිසිලෙස භාවිතා කිරීම

- නායකයාගේ භූමිකාව -
  උදා : - සේවකයින් පෙළඹවීම හා අවශ්‍ය මඟ පෙන්වීම
  කාර්ය ඉටු කර ගැනීමේදී සේවකයින් මෙහෙයවීම
  මානව සම්පත නිසි පරිදි මෙහෙයවීම

**(භූමිකා එකකට ලකුණු $^1/_2$ බැගින් භූමිකා 2කට ලකුණු 01 යි)**

**(උදාහරණ එකකට ලකුණු $^1/_2$ බැගින් උදාහරණ 2කට ලකුණු 01 යි)**

(v) ව්‍යාපාරයකට සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.

- ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය කරගත හැකිවීම
- ව්‍යාපාරයේ දිගු කාලීන පැවැත්ම ස්ථාපිත කරගත හැකිවීම
- පැන නැගිය හැකි නීතිමය ප්‍රශ්න අවම කරගත හැකිවීම
- ව්‍යාපාරයේ භාණ්ඩ හෝ සේවාවලට ඇති ඉල්ලුම ඉහළයාම මඟින් ඉහළ ලාභදායකත්වයක් සහතික කරගත හැකිවීම
- සේවකයින්ගේ චිත්ත ධෛර්ය ඉහළ යාම හා ව්‍යාපාරය කෙරෙහි ඇති ලැදියාව වර්ධනය වීම

**(ප්‍රතිලාභ එකකට ලකුණු $^1/_2$ බැගින් ප්‍රතිලාභ 4කට ලකුණු 02 යි)**

| 6 | (i) | (ii) | (iii) | (iv) | (v) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| | 2 | 2 | 2 | 2 | 2 | 10/10 |

**7.** සුදේශ්ගේ යෝජිත නිෂ්පාදන ව්‍යාපාරය වෙනුවෙන් සකස් කරන ලද ආයෝජන සැලැස්මෙහි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| අයිතිකරුගේ මුදල් යෙදවීම් | 600 000 |
| බැංකු ණය | 300 000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | 500 000 |
| ව්‍යාපාර සැලසුම සකස් කිරීම | 33 000 |
| කර්මාන්තශාලා භූමිය සැකසීම | 12 000 |
| වෙළඳපොළ සමීක්ෂණ වියදම | 10 000 |
| ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා වියදම | 5 000 |
| ජල පහසුකම් ලබා ගැනීම | 40 000 |
| මහන මැෂින් මිල දී ගැනීම | 400 000 |
| පරිගණක මිල දී ගැනීම | 250 000 |
| නිෂ්පාදන වියදම් | 330 000 |
| ආරම්භක දින උත්සව වියදම් | 20 000 |

**අවශ්‍ය වන්නේ,**

සුදේශ්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර, කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය (වෙනස) දැක්වීම

| සුදේශ්ගේ ව්‍යාපාරය ½<br>ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ½ | | |
|---|---|---|
| මුදල් ගලා ඒම් :- ½ | | |
| අයිතිකරුගේ මුදල් යෙදවීම් | 600 000 ½ | |
| බැංකු ණය | 300 000 ½ | |
| අපේක්ෂිත අලෙවි ආදායම | 500 000 ½ | |
| මුළු මුදල් ගලා ඒම් | | 140 0000 ½ |
| මුදල් ගලා යාම් :- ½ | | |
| ව්‍යාපාර සැලසුම සකස් කිරීම | 33 000 | |
| කර්මාන්ත ශාලා භූමිය සැකසීම | 12 000 | |
| වෙළඳපොළ සමීක්ෂණ වියදම් | 10 000 | |
| ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා වියදම් | 5 000 | |
| ජල පහසුකම් ලබා ගැනීම | 40 000 | |
| මහන මැෂින් මිලදී ගැනීම | 400 000 | ½ X 9 = 04 ½ |
| පරිගණක මිලදී ගැනීම | 250 000 | |
| නිෂ්පාදන වියදම් | 330 000 | |
| ආරම්භක දින උත්සව වියදම් | 20 000 | |
| මුළු මුදල් ගලා යාම් | | 110 0000 ½ |
| කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය | | 300 000 1 |

**( මුළු ලකුණු 10 යි)**

WWW.OLEVELAPI.COM